# ලංකාවේ දේවදූත සහ ජපානයේ විගෝ සං

එම්. එච්. ගුණතිලක

**මත්සුරි** (matsuri) යනුව ජපාන භාෂාවෙහි ව්‍යවහාර වන්නේ 'උත්සවය' යන අරුතිනි. එබඳු මත්සුරි රැසක් මුළු අවුරුද්ද පුරා අඛණ්ඩ ව පැවැත්වෙයි.[1]

ජනවාරි මස පළමු වැනි දිනයෙහි හරසරින් පැවැත්වෙන, ගංජිත්සු (Ganjitsu) නමැති ජාතික නිදහස් දින උත්සවයෙන් ඇරඹෙන මත්සුරි උත්සව මාලාව, වසර අග, එනම්, දෙසැම්බර් 31 වැනි දා දක්වා ම යම් යම් ප්‍රදේශවල විසිර් (ඇතැම් පෙදෙස්වල මහා පරිමාණයෙනුත්, යම් යම් පෙදෙස්වල සුළු පරිමාණයෙනුත්) පවත්නේ ය. **අකිත** (akita) ප්‍රදේශයෙහි අවුරුදු උදාව නිමිති කරගෙන දෙසැම්බර් 31 වැනි දා පැවැත්වෙන **හගුරොයම ෂොරෙයිසයි** (Haguroyama Shoreisai) **මත්සුරිය** එම උත්සව මාලාවේ අග හැටියට ගැණෙන්නේ ද නැත. ගංජිත්සු මත්සුරිය ඊළඟ දිනයෙහි පැවැත්වෙන හෙයිනි.

**මත්සුරි** පැවැත්වීමෙන් ඉටු කර ගන්නා අරමුණු විවිධ ය. ඇතැම් අරමුණු ආගමික විය හැකි ය. ඇතැම් අරමුණු ලෞකික වියහැකි ය. සමහර අවස්ථාවල දී ආගමික සහ ලෞකික අරමුණු අතර අනුකලනයක් ද දිස්විය හැකි ය.

ජපාන ජාතිකයාගේ ජීවන දෘෂ්ටිය, ඔහු ලෝකය දෙස බලන ආකාරය, ජපාන මත්සුරිවල ගැඹුරු අර්ථය අවබෝධ කර ගැනීමෙන් අනාවරණය කර ගත හැකි බව **සෝෆියා** සරසවියෙහි ජපාන භාෂාව ඉගැන්වීමේ නියුක්ත පීඨාධිපති, **විලියම් කරිගේ** අදහස යි.[2] ලංකාවේ විහාරස්ථානවලට සහ දේවාලවලට සම්බන්ධ උත්සවවල දී පැවැත්වෙන පෙරහැරවල ස්වරූපයක් ද මත්සුරිවල බාහිර වශයෙන් දක්නට ලැබේ. වෙනෙහාස් කගා නාවුකුන